සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ශෛවනෙරි	I, II
சைவநெறி	I, II
Saivanery	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය	-	මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	-	10 நிமிடங்கள்
Additional Reading Time	-	10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශෛවනෙරි I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "ඓන්දුකරත් තානෛමුගප් පෙරුමාලේ" යන ගීතිකා පේළිය මගින් ප්‍රශංසා ලබනුයේ,
(1) ශිව දෙවියන් ය. (2) තිරුමාල් ය. (3) විනායහර් ය. (4) මුරුගන් ය.

2. හින්දු ආගමේ විශේෂිත ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,
(1) වේදම් ය. (2) ආගමම් ය. (3) තිරුමුරෙ ය. (4) කන්ද පුරාණම් ය.

3. සංගීතයට වැදගත්කමක් ලබාදෙන වේදය කුමක් ද?
(1) සෘග් වේදය (2) යජුර් වේදය (3) සාම වේදය (4) අතර්ව වේදය

4. විතම්බරම් දේවාලයේ ඉතිහාසය පැහැදිලි කරන ග්‍රන්ථය වන්නේ,
(1) සේක්කිලාර් පුරාණම් ය. (2) කන්ද පුරාණම් ය.
(3) පෙරිය පුරාණම් ය. (4) කෝයිට් පුරාණම් ය.

5. දක්ෂිණකෛලාස පුරාණම් මගින් විශිෂ්ටත්වයට පත් වූ ශ්‍රී ලාංකීය දේවාලය වන්නේ,
(1) තිරුකෝණේශ්වරම් ය. (2) තිරුකේදීශ්වරම් ය.
(3) මුන්නේශ්වරම් ය. (4) නගුලේශ්වරම් ය.

6. ශ්‍රී ලංකාව 'ශිව භූමි' යනුවෙන් ප්‍රශංසා කරන ලද්දේ,
(1) අරුණගිරිනාදර් විසිනි. (2) ආරුමුග නාවලර් විසිනි.
(3) පූසලාර් විසිනි. (4) තිරුමූලර් විසිනි.

7. "වෙල්ලෙ නිරප් පූවුමල්ල වේරෙන්ද මලරුම් අල්ල උල්ලක් කමලමඩි උත්තමනාර් වේණ්ඩුවදු..." යනුවෙන් ගායනා කරන ලද්දේ,
(1) ආරුමුග නාවලර් විසිනි. (2) ස්වාමි විපුලානන්තර් විසිනි.
(3) තිරුමූලර් විසිනි. (4) අරුණගිරිනාදර් විසිනි.

8. දෙවියන්ගේ දේව ක්‍රියා පහෙන් 'අනුක්කිරහම්' යනු
(1) මැවීම වේ. (2) රැකගැනීම වේ.
(3) ආශිර්වාද කිරීම වේ. (4) නොපෙන්වීම වේ.

9. ශිව භක්තිකයන්ගේ මහිමය පිළිබඳව සුන්තරමූර්ති නායනාර් තුමා විසින් ගායනා කරන ලද්දේ,
(1) තිරුතොණ්ඩත් තොගෙ ය. (2) තිරුතොණ්ඩර් පුරාණම් ය.
(3) තිරුතොණ්ඩර් තිරුවන්දාදි ය. (4) තිරුමුරෙකණ්ඩ පුරාණම් ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

23. 'පිරත්තියට්සම්' යනු,
(1) සෘෂිවරුන් විසින් ප්‍රකාශ කරන ලද සත්‍ය වාක්‍ය වේ.
(2) එකක් මගින් තවත් යමක් අනුමාන කිරීමයි.
(3) ඉන්ද්‍රියන් මගින් ලබා ගන්නා ඥානය වේ.
(4) පොත්පත් මගින් ලබා ගන්නා ඥානය වේ.

24. හින්දු භක්තිකයන්ගේ විශ්වාසයට අනුව දිනක සීමාව යනු,
(1) හිරු උදාවේ සිට ඊළඟ දිනයේ හිරු උදාව දක්වා වන කාලයයි.
(2) මධ්‍යම දහවල් සිට ඊළඟ දිනයේ මධ්‍යම දහවල් දක්වා වන කාලයයි.
(3) හිරු බැස යාම සිට ඊළඟ දිනයේ හිරු බැස යාම දක්වා වන කාලයයි.
(4) මධ්‍යම රාත්‍රිය සිට ඊළඟ දිනයේ මධ්‍යම රාත්‍රිය දක්වා වන කාලයයි.

25. පුරච්චන්දාන කුරවර්ලා පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) මෙයිකණ්ඩ තේවර්, අරුණන්ති සිවාචාරියාර්, මරෙඥාන සම්බන්තර්
(2) සනට්කුමාර මුනිවර්, සත්‍යඥානතරිසිනිහල්, උමාපති සිවාචාරියාර්
(3) තිරුතන්නි තේවර්, සනට්කුමාර මුනිවර්, පරංජෝති මුනිවර්
(4) අරුණන්ති සිවාචාරියාර්, සනට්කුමාර මුනිවර්, මරෙඥාන සම්බන්තර්

26. ශෛව ආගමික මුතුන් මිත්තන් විසින් 'ආවුරෝංජු ගල්' නිර්මාණය කිරීමේ අරමුණ වූයේ,
(1) මඟීන්ට විවේක ලබා ගැනීමට ය.
(2) සතුන්ට තම ශරීරයේ ඇති කිණිතුල්ලන් ආදිය ඉවත් කර ගැනීමට ය.
(3) සතුන්ට තමන්ගේ පිපාසය නැති කර ගැනීමට ය.
(4) මියගිය සොල්දාදුවන් සිහිපත් කර නමස්කාර කිරීමට ය.

27. ආණවම් 'සගසමලම්' යනුවෙන් හැඳින්වීමට හේතුව කුමක් ද?
(1) අඳුරට වඩා ආණවම් දරුණු බැවිනි.
(2) අඳුර සේම නොපෙන්වන ස්වභාවයක් ඇති බැවිනි.
(3) ආත්මය සමඟ එකටම උපන් බැවිනි.
(4) තුන් වාර්ගික ආත්මවල වැළඳී තිබෙන බැවිනි.

28. "යාවර්ක්කුමාම් පිරර්ක්කු ඉන්නුරෙත්තානේ" යන තිරුමන්ත්‍ර ගීතිකා පේළිය පෙන්නුම් කරන උතුම් ගුණය වන්නේ,
(1) දිනපතා දෙවි වන්දනාවේ යෙදිය යුතු බවයි.
(2) සත්වයන්ට දයාව දැක්විය යුතු බවයි.
(3) කුසගින්නේ සිටින අයගේ කුසගින්න නිවිය යුතු බවයි.
(4) අන් අයට කරුණාවන්ත වචන වලින් කථා කළ යුතු බවයි.

29. මහොත්වයේ සිදුවන තිරුකල්යාණම් මගින් පෙන්නුම් කරනු ලබන්නේ,
(1) ආණවම් තම බල අහිමි වී, ආත්මය මළවලින් බේරීම පිණිස දේව ආශිර්වාදය උපකාරී වන බව ය.
(2) කරුණා හැඩැති ශක්ති ප්‍රබුද්ධ ශිව දෙවියන් සමගින් මිශ්‍ර වී ප්‍රහංජය ක්‍රියාකරවීම යන්න ය.
(3) ලොකයේ ධාන්‍ය වර්ධනය බාධාවකින් තොරව සිදුවීමට දෙවියන් ආශිර්වාද කිරීම යන්න ය.
(4) දෙවියන් එක් කෙනෙකි යන දර්ශනය සියලු ජීවීන් දැනගත යුතුයි යන්න ය.

30. කණ්ණකීව මිනිස් ස්ත්‍රියක් ලෙස නොව, පරාශක්තිගේ ස්වරූපයක් ලෙස සැලකෙන ශ්‍රී ලාංකීය සාහිත්‍ය පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) කණ්ණකි වලක්කුරෙ, සිලප්පතිකාරම්, කෝවලනාර් කදෙ
(2) කණ්ණකි වලක්කුරෙ, සිලප්පතිකාරම්, සිලම්බු කුරල්
(3) සිලප්පතිකාරම්, කෝවලනාර් කදෙ, සිලම්බු කුරල්
(4) කණ්ණකි වලක්කුරෙ, කෝවලනාර් කදෙ, සිලම්බු කුරල්

31. 'තීට්සෙ' යන්නෙහි තේරුම වන්නේ,
(1) මළ වර්ග ලබා දී ඥානය නැති කරන්නකි.
(2) මළ වර්ග නැතිකර ඥානය ලබා දෙන්නකි.
(3) මළ වර්ග සහ ඥානය ලබා දෙන්නකි.
(4) මළ වර්ග සහ ඥානය නැති කරන්නකි.

32. 'ජීවන්මුත්ති' යනු,
(1) ආත්මය ශරීරය සමඟින් සිටින අවස්ථාවේ ලැබෙන්නකි.
(2) ආත්මය ශරීරයෙන් පිටව ගිය පසු ලැබෙන්නකි.
(3) ආත්මය ලෞකික සැප සම්පත්වල යෙදීමයි.
(4) ආත්මය අසත්තු සමඟින් සිටින තත්ත්වයයි.

[ඉතිරිවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ශෛවනෙරි	I, II
சைவநெறி	I, II
Saivanery	I, II

ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'පරාබරක් කණ්ණි' යන ග්‍රන්ථයට එම නම ලැබීමට හේතුව කුමක් ද?

(ii) මහාලයපට්සම් හි සිදුවන වැදගත් ක්‍රියා **දෙක** මොනවා ද?

(iii) සිතේ දිව්‍යමය සිතුවිලි ඇතිවීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

(iv) මාණික්කවාසහර් රචනා කළ පනුවල් **දෙකක්** සඳහන් කරන්න.

(v) දන්සල් අතර බත් දන්සල වැදගත්වීමට හේතුව කුමක් ද?

(vi) තිලකවතියාර් තාපස ජීවිතයේ යෙදීමට හේතුව කුමක් ද?

(vii) ග්‍රාමීය කලා **දෙකක්** සඳහන් කරන්න.

(viii) හින්දු භක්තිකයන්ගේ විවාහ පිළිවෙතේ තැල්ල බැඳීමෙන් පසුව මනමාලිය මනමාලයාගේ වම්පස අසුන් ගැන්වීමේ මූලික සිද්ධාන්තය කුමක් ද?

(ix) සිංගෙ පරරාසසේකරන්, නල්ලූර් කන්දස්වාමි දේවාලය කේන්ද්‍රකර ගනිමින් සතර සීමාවල ස්ථාපිත කළ දේවාල මොනවා ද?

(x) භගවත්ගීතාව සහ ධම්මපද යන ග්‍රන්ථ දෙකෙහිම සඳහන් වන පොදු අදහස් **දෙකක්** සඳහන් කරන්න.

2. (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(අ) "තනම් තරුම් කල්වි..."

(ආ) "යාවර්ක්කුමාම් ඉරෙවට්කු..."

(ඉ) "කට්ට්‍රවර් විලුංගුම් කට්පහක්..."

(ඊ) "මූවීරු මුහංගල් පෝට්‍රි..."

(උ) "උන්නුම් සෝරු පරුගුම් නීර්..."

(ii) ඉහත (i) හි සඳහන් ගීතිකාවල අදහස සරලව ලියන්න.

3. "නාම් ආර්ක්කුම් කුඩියල්ලෝම් නමනෙ අංජෝම්"

– තිරුනාවුක්කරසර් –

(i) තිරුනාවුක්කරසර් 'උලවාරප් පඩෙයාලි' යනුවෙන් හඳුන්වනු ලැබීමට හේතුව කුමක් ද?

(ii) තිරුනාවුක්කරසර් සහ තිරුඥානසම්බන්තර් එකතු වී කළ සේවා **දෙකක්** සඳහන් කරන්න.

(iii) අප්පුදියඩිහල්, තිරුනාවුක්කරසර් කෙරෙහි ඇතිකර ගත් භක්තිය පිළිබඳව කෙටියෙන් පහදන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/